සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

**12 ශ්‍රේණිය**

**කාලය පැය 01 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- නිවැරදි හා වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් හිමිවේ.

---

(01) සන්නිවේදනය යනු ''යම් තැනකදී තොරාගත් පණිවුඩයක් වෙනත් තැනක ඒ ආකාරයෙන් ප්‍රතිනිර්මාණය කිරීමයි'' මෙම අදහස ප්‍රකාශ කරනු ලැබුවේ,

(1) විල්බර් ශ්‍රාම්ය. (2) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ය.

(3) ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර්ය (4) චාල්ස් ඔස්ගුඩ්ය.

(5) ඩේවිඩ් කේ. බර්ලෝය. (........)

(02) ප්‍රාග් මානවයා ජීවත් වූ ගුහාවල අඳින ලද සිතුවමින් පැහැදිලි වන්නේ,

(1) එකල පැවැති සමාජ ලක්ෂණයයි.

(2) භාෂා භාවිතයට පෙර මිනිසා සිය අදහස් ප්‍රකාශ කළ ආකාරයයි.

(3) අතීත මිනිසාගේ කලා කුසලතාවයයි.

(4) ඔවුන් විනෝද වූ අකාරයයි.

(5) වාසස්ථානය අලංකාරවත් කිරීමයි. (........)

(03) සන්නිවේදනය පිළිබඳ සරල අර්ථකථනයක් ඉදිරිපත් කළ පුද්ගලයෙක් වන්නේ,

(1) ජෝර්ජ් ඊට්ස්මන්ය. (2) ට්සායි ලූන්ය.

(3) ගුටෙන්බර්ග්ය. (4) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ය.

(5) මාර්කෝනිය. (........)

(04) බලයේ සිටින රාජ්‍ය නායකයකු හෝ රාජ්‍යයක් මගින් මාධ්‍ය දැඩිව පාලනය කළේ,

(1) සෝවියට් කොමියුනිස්ට් සන්නිවේදන සංකල්පයේය.

(2) සංවර්ධන සන්නිවේදන සංකල්පයේය.

(3) අධිපතිවාදී සන්නිවේදන සංකල්පයේය.

(4) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පයේය.

(5) සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පයේය. (........)

(05) සමූහික සන්නිවේදනය කෙරෙහි දැකිය නොහැකි අංග ලක්ෂණයක් වන්නේ,

(1) පිරිස අභිමුඛව අමතන්නෙක් සිටීම.

(2) ග්‍රාහක පිරිසක් සිටීම.

(3) තාක්ෂණික මෙවලම් භාවිතා කළ හැකි වීම.

(4) දුරකථනය භාවිතා කළ හැකි වීම.

(5) ඇස් සබඳතාවය පැවැත්වීම. (........)

(06) සංවර්ධන සන්නිවේදන සංකල්පය මගින් කියැවෙන්නේ,

(1) ප්‍රජාතන්ත්‍රවාදීව පොදු මහජනතාවගේ නියෝජනය සහිතව මාධ්‍ය හැසිරවිය යුතු බව.

(2) පොදු සුභසිද්ධිය අරමුණු කරගෙන මාධ්‍ය නිදහස හා වගකීම් රජය පාලනය කළ යතු බව.

(3) සන්නිවේදනය හා මාධ්‍ය ක්‍රියාවලියට නිදහසේ හැසිරෙන්නට ඉඩ දිය යුතු බව.

(4) රජය මෙන්ම මාධ්‍යයද සමාජය කෙරෙහි වගකීමෙන් යුතුව මාධ්‍ය හැසිරවිය යුතු බව.

(5) ජාතික සංවර්ධනය අරමුණු කරගෙන සන්නිවේදනය හා මාධ්‍යය හැසිරවිය යුතු බව. (........)

(7) උදෑසනම කාර්යාලයට පිවිසි කමල් තමන්ට පැවරී ඇති වගකීම් පිළිබඳ කල්පනා කළේය. මෙය අයත් වන සන්නිවේදන වර්ගය වන්නේ,

(1) අන්තර්වර්තී සන්නිවේදනයට ය.

(2) සමූහ සන්නිවේදනයට ය.

(3) අන්තර් පුද්ගල සන්නිවේදනයට ය.

(4) පුද්ගලාන්තර සන්නිවේදනයට ය.

(5) මානසික සන්නිවේදනයට ය. (........)

(8) පුවත්පත, ගුවන් විදුලිය හා රූපවාහිනිය යන මාධ්‍ය වලට අනුව ග්‍රාහකයා හඳුන්වන අනුපිළිවෙල වන්නේ,

(1) රචකයා, පාඨකයා හා ප්‍රේක්ෂකයා ය. (2) පාඨකයා, ශ්‍රාවකයා හා ප්‍රේක්ෂකයා ය.

(3) කර්තෘ, නිවේදකයා හා සංස්කාරකයා ය. (4) සංස්කාරක, ශ්‍රාවකයා හා නළුවා ය.

(5) ලේඛකයා, නිවේදකයා හා රසිකයා ය. (........)

(9) ජනමාධ්‍ය මගින් ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේදී ඒවා යම් යම් වාරණයන්ට හසු වේ. මෙම කටයුත්තට සෘජුවම දායක වන පුද්ගලයින් හඳුන්වන්නේ,

(1) වාර්තාකරුවන් ලෙසය. (2) නිසිබලධරයන් ලෙසය.

(3) විධායක නිලධාරීන් ලෙසය. (4) දොරටුපාලකයන් ලෙසය.

(5) සංස්කාරකවරු ලෙසය. (........)

(10) සමාජයක විකල්ප මාධ්‍ය භාවිතය උත්සන්න වීමට මූලික වශයෙන් බලපාන්නේ,

(1) අධිපතිවාදී මාධ්‍ය ප්‍රවණතා තීව්‍ර වීමය.

(2) නිදහස් මාධ්‍ය ප්‍රවණතා පැතිරයාමය.

(3) සංවර්ධනාභිමුඛ මාධ්‍ය භාවිතය වර්ධනය වීමය.

(4) නව මාධ්‍ය ව්‍යාප්ත වීමය.

(5) සාක්ෂරතාවය වර්ධනය වීමය. (........)

(11) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ගේ සන්නිවේදන ආකෘතිය

A - චක්‍රීය ගලායාමක් සහිත වූවකි.

B - 'බලපෑම' පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන්නෙකි.

C - 'ග්‍රාහකයා' පිළිබඳ අඩු සැලකිල්ලක් දක්වන්නකි.

D - සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග 4 ක් මත පදනම් වූවකි.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) A හා B පමණක් සත්‍ය වේ. (2) B හා C පමණක් සත්‍ය වේ.

(3) C හා D පමණක් සත්‍ය වේ. (4) A, B, C හා D සියල්ලම සත්‍ය වේ.

(4) A, B, C හා D සියල්ලම අසත්‍යය වේ. (........)

(12) සිය මෝටර් රථයට මිනිසකු යටකර පලාගිය පුද්ගලයෙකු නීතියේ රැහැනට ගන්නැයි බලකරමින් පොලීසිය ඉදිරියේ උද්ඝෝෂණයක නිරත වූ කණ්ඩායමක්,

(1) ක්‍රියාකාරී කණ්ඩායමකි. (2) අහුඹු කණ්ඩායමකි.

(3) විශෝධන කණ්ඩායමකි. (4) ප්‍රතිපත්ති කණ්ඩායමකි.

(5) තාර්කික කණ්ඩායමකි. (........)

(13) ආයතනයක ව්‍යාපාරික ව්‍යාපෘතියක් ක්‍රියාත්ම කිරීමට එකතු වූ කණ්ඩායමක්,

(1) අහඹු කණ්ඩායමකි. (2) ක්‍රියාකාරී කණ්ඩායමකි.

(3) ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායමකි. (4) විශෝධන කණ්ඩායමකි.

(5) ඉගෙනුම් කණ්ඩායමකි. (........)

(14) කෙනෙකු තමන්ට නිශ්චිත සම්බන්ධතාවක් ඇති තවත් කිහිප දෙනෙකුට තොරතුරු ලබාදෙන අතර ඒ තැනැත්තාද එසේම කරයි. මෙය අයත් අවිධිමත් දාමය වන්නේ,

(1) ඕපාදූප දාමයටය. (2) තනි දාමයටය.

(3) සම්භාවිතා දාමයටය (4) පර්ෂද දාමයටය.

(5) තනි හා ඕපාදූප දාමයටය. (........)

(15) සන්නිවේදන ආකෘතියක් යනු,

(1) තොරතුරු හා අදහස් හුවමාරුවකි.

(2) ග්‍රාහකයන් ක්ෂේත්‍රයට බලපෑම් කරන්නකි.

(3) සන්නිවේදන ස්වරූපය හා වර්ග පිළිබඳ අධ්‍යයනයකි.

(4) සන්නිවේදනය පිළිබඳ කෙටි සටහනකි.

(5) සන්නිවේදන ක්‍රියාවලිය සරලව හා විද්‍යාත්මකව පැහැදිලි කරන්නකි. (........)

(16) නූතන ජනමාධ්‍ය හා සාපේක්ෂව සාම්ප්‍රදායික මාධ්‍ය තුළ දක්නට නොලැබෙන ලක්ෂණය වන්නේ,

(1) පුද්ගලභාවයන්ට වඩාත් සමීප වීමයි.

(2) ආකෘතියේ හා අන්තර්ගතයේ සමීප බවයි.

(3) ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර යොදාගනියි.

(4) වැඩි පෙළඹවීමකින් යුක්ත වීමයි.

(5) සංවිධානගත වූ ව්‍යුහයකින් යුක්ත වීමයි. (........)

(17) විශාල සම්මන්ත්‍රණ ශාලාවක දේශණයක් පැවැත්වීමට පැමිණෙන කථිකයා තමන්ගේ පහසුව සඳහා ඇති සන්නිවේදන උපකරණ පිළිබඳව විමසයි. ඔහුට ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වන්නේ,

(1) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ උපකරණයකි.

(2) ශබ්ද විකාශණ උපකරණයකි.

(3) උරහිස් ප්‍රක්ෂේපණ උපකරණයකි.

(4) විනිවිදක ප්‍රක්ෂේපණ උපකරණයකි.

(5) රැහැන් රහිත මයික්‍රෆෝනයකි. (........)

(18) සමූහ සන්නිවේදනයේ කණ්ඩායම් වර්ග 5 කි. එනම්,

A - අහඹු කණ්ඩායම්.

B - විශෝධන කණ්ඩායම්.

C - ඉගෙනුම් කණ්ඩායම්.

D - ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායම්.

E - ක්‍රියාකාරී කණ්ඩායම්.

මෙයින් විධිමත් කණ්ඩායම් වන්නේ,

(1) A, B, C, E (2) A, B, C, D

(3) B, C, D, E (4) A, C, D, E

(3) A, B, D, E (........)

(19) උප භාෂාවක් පිළිබඳව හඳුන්වා දීමේදී එයට අදාළ නොවන කරුණ තෝරන්න.

(1) ප්‍රධාන භාෂා ධාරාවේ අනු ධාරාවක් වීම. (2) උප සංස්කෘතික ලක්ෂණ වලින් යුක්ත වීම.

(3) උපකාරක භාෂා ලක්ෂණවලින් යුක්ත වීම. (4) ප්‍රාදේශීය භාෂා ලක්ෂණ වලින් යුක්ත වීම.

(5) සීමිත කණ්ඩායම් අතර භාවිතා වීම. (........)

(20) ස්වසංකල්පය පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - උපතින් පුද්ගලයා සතුවන්නකි.

B - අන් අය සමග අන්තර් ක්‍රියාවෙහි යෙදීමේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වන්නකි.

C - සන්නිවේදන ක්‍රියාවලිය හේතුකොට ගෙන වර්ධනය වන්නකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

(1) A පමණි. (2) B පමණි.

(3) A හා B පමණි. (4) B හා C පමණි.

(5) A හා C පමණි. (........)

1x20=20

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

**12 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- තෝරාගත් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් හිමිවේ.

---

01. (i) සාර්ථක සන්නිවේදනයක් සඳහා තිබිය යුතු මූලික අංග රූප සටහනක් ඇසුරෙන් නම් කර පැහැදිලි කරන්න. (ල. 08)

(ii) අධිපතිවාදී සන්නිවේදන සංකල්පයේ දක්නට ලැබෙන ලක්ෂණ 2 ක් කෙටියෙන් පහදන්න.(ල. 04)

(iii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ විශේෂතා 4 ක් දක්වා ඒවා පැහැදිලි කරන්න. (ල. 08)


02. (i) ගෝලීයකරණය යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 04)

(ii) පුරවැසි මාධ්‍ය වාර්තාකරණයේ මූලික ලක්ෂණ 2 ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.(ල. 04)

(iii) විකල්ප ජනමාධ්‍යයක ලක්ෂණ 4 ක් නම්කර ඉන් දෙකක් පැහැදිලි කරන්න. (ල. 08)

(iv) සමූහ සන්නිවේදන ක්‍රියාවලියක් සාර්ථක වීමට බලපාන නිපුණතා 4 ක් නම් කරන්න. (ල. 04)

03.




(i) ඉහත දැක්වෙන සන්නිවේදන ආකෘතිය නම් කරන්න. (ල. 02)

(ii) ඉහත රූප සටහනේ 1, 2, 3, 4, 5, 6, නම් කරන්න. (ල. 06)

(iii) සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංගයක් වන 6 හි ප්‍රභේද දක්වා ජනසන්නිවේදනයේ දී ඒවා පිළිබඳ සැලකිලිමත් වීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 06)

(iv) සන්නිවේදනයේ වැදගත්කම පහත කරුණු ඇසුරින් පැහැදිලි කරන්න.
1. තොරතුරු සම්පාදනය 2. සමාජානුයෝජනය (ල. 06)

04. පෞද්ගලික සමාගමක රැකියාවක් සඳහා සම්මුඛ සාකච්ඡාවකට පෙනී සිටි මිහාරිට ඇය ඒ සඳහා තෝරාගත් බව ලිපියකින් දැනුම් දී තිබුණි.

(i) ඉහත විස්තරයේ සන්නිවේදන ස්වරූප 2 ක් නම්කර, අදාළ අවස්ථා මොනවාදැයි දක්වන්න. (ල. 02)

(ii) ඉහත විස්තරයේ සඳහන් නොවන සන්නිවේදන වර්ග 2 ක් දක්වන්න. (ල. 02)

(iii) ජන සන්නිවේදනයේ සුවිශේෂතා 4 ක් දක්වා ඉන් 2 ක් පැහැදිලි කරන්න. (ල. 08)

(iv) පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා භාවිතා කළ හැකි ප්‍රක්ෂේපනීය මාධ්‍ය උපකරණ 2 ක් දක්වා ඉන් 1 ක් ඵලදායීව යොදාගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ල. 08)

05. (i) ජීව භාෂාවක ලක්ෂණ 4 ක් දක්වා ඉන් 1 ක් පැහැදිලි කරන්න. (ල. 04)

(ii) ගුවන් විදුලි මාධ්‍යයේදී භාෂාව යොදාගන්නා ආකාර 2 ක් පහත දැක්වේ. ඒවා පැහැදිලි කරන්න.
1. රූපණය 2. ලේඛණය

(iii) ශ්‍රාම්බස්ගුඩ් සන්නිවේදන ආකෘතියෙහි අන්තර්ගත ප්‍රධාන කරුණු 2 ක් වන ආකේතිකරණය හා විකේතිකරණය වෙන වෙනම විස්තර කරන්න. උදාහරණ දෙන්න. (ල. 08)